

# ශ්‍රී ලංකාවේ රබර් ගසේ මුල් බිම

# හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය

**ශ්‍රී ලංකාවේ ප්‍රධානතම උද්භිද උද්‍යාන තුනම ආරම්භ වූයේ බ්‍රිතාන්‍ය පාලන කාලය තුළ ය. ඉන් විශාලතම උද්භිද උද්‍යානය පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය වන අතර, විශාලත්වයෙන් දෙවැන්න වනුයේ හග්ගල උද්භිද උද්‍යානයයි. කෙසේ වුවද, හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය වඩාත් වැදගත් වනුයේ කොළඹට ඉතා ආසන්නයේම පිහිටි හා කොළඹ සිට සුළු කාලයක් තුළ දී ළඟාවිය හැකි උද්භිද උද්‍යානය වශයෙනි.**

හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය නැතහොත් කවුරුත් හොඳින් දන්නා ගම්පහ උද්භිද උද්‍යානය පිහිටා ඇත්තේ කොළඹ සිට කි.මී. 20 ක් පමණ දුරකිනි.

කලබලකාරී නාගරික ජීවන වටපිටාවෙන් මඳක් මිදී ගස් කොළං පිරුණු නිහඬ පරිසරයක මඳක් හෝ රැඳී සිටින්නට කාටත් අවස්ථාව සලසාදීමට ගම්පහ උද්භිද උද්‍යානය සැදී පැහැදී සිටින බව ඔබ සමහරවිට නොදන්නවා විය හැකි ය. කොළඹ සිට වාහනයෙකින් හෝ දුම්රියෙන් ගම්පහ නගරයට පැමිණ ගම්පහ දුම්රිය ස්ථානය පසුපසින් පිහිටි ගම්පහ - මිනුවන්ගොඩ මහ මාර්ගයේ යාර 500 ක දුරකින් මෙම උද්භිද උද්‍යානය පිහිටා තිබේ. විවිධත්වයෙන් යුතු ගස් වර්ග, පැළැටි හා මල් වර්ග 1500 ට වැඩි ප්‍රමාණයකට නිවහන් සලසන අක්කර 36 ක පමණ භූමි ප්‍රමාණයෙන් වසාගත් මෙම උද්‍යානය තුළ ක්‍රීඩා පිටියක් මෙන්ම ළමා පිටික් ද ඇතුළත් වේ.

පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය ස්ථාපිත කර අඩ සියවසකට පසු එනම්, 1876 වර්ෂයේ දී මෙම උද්භිද උද්‍යානය ස්ථාපිත කර තිබේ.

ගම්පහ උද්‍යානය වඩාත් ප්‍රකටව ඇත්තේ ආසියාවේ ප්‍රථම රබර් ගස වගාකරනු ලැබුවේ මෙම උද්‍යානය තුළ වීම නිසා ය. රබර් ගසෙහි ජන්ම භූමිය වූයේ දකුණු ඇමරිකාවේ ටැපහොස් සානුවේ පිහිටි ඇමේසන් වනාන්තරයයි.

ඇමේසන් වනාන්තරයට ආවේණික පැළැටි හා ඇට කිසිවක් ඉන් පිටස්තර දේශයකට ගෙනයාමට අවසර නුදුන් කාලයක ශ්‍රීමත් හෙන්රි වික්හම් නම්වූ නිර්භීත තරුණ ඉංග්‍රීසි ජාතිකයා කිසිවෙකුගේ අනුදැනුමකින් තොරව රබර් ඇට දහස් ගණනක් හොර රහසේම එංගලන්තයේ ප්‍රසිද්ධ කිව් උද්‍යානය වෙත ප්‍රවාහනය කරන ලදී.

1876 සැප්තැම්බර් මස 09 වෙනි දින එංගලන්තයෙන් ලංකාව බලා සමුද්‍රා ගමනය ආරම්භ කළ ඩෙවොන්ෂෙයර්හි HMS ඩියුක් නෞකාව මගින් මලු 38 ක බහාලූ රබර් ඇට තොගයක් රැගෙන ආවේය. හෙවියා බ්‍රසලියන්සිස් විශේෂයට අයත්





එබඳු ඇට 1919 ක් ලංකාව වෙත එවනු ලැබූ අතර ඒවා කොළඹ වරායේ සිට කෙලින්ම පේරාදෙණිය රාජකීය උද්‍යානය වෙත යවන ලදී.

කෙසේ වුවද ඇමර්සන් ටැපහොස් සාතුවේ දේශගුණයට බොහෝ සෙයින් සමාන දේශගුණයක් සහිත හෙනරත්ගොඩ උද්‍යානය පේරාදෙණිය උද්‍යානයට වඩා සුදුසු බව නිගමනය කිරීමෙන් පසු මෙම පැල හෙනරත්ගොඩ උද්‍යානයේ රෝපනය කිරීම සඳහා ගෙන එන ලදී.

එවක ප්‍රමුඛ පෙළේ ධනවත් වැවිලිකරුවෙකු වූ ඒ.ද.සොයිසා මුදලිතුමාගෙන් 1876 දී රබර් ඇට සිටුවීම සඳහා උද්‍යානය සූදනම් කිරීම සහතික කරමින් මෙහි ප්‍රථම උද්‍යාන පාලක බවට පත්විය.

එවක පේරාදෙණිය උද්භිද උද්‍යානයේ අධ්‍යක්‍ෂව සිටි ආචාර්ය ත්වේට්ස්ගේ මූලික මගපෙන්වීම යටතේ ප්‍රථම රබර් පැල රෝපණය සිදුවූ අතර, සැමගේ සිත සතුටට පත්කරමින් 1881 දී රබර් පැල මල්බරවීම ආරම්භ විය.

ඉන්දියාව, බුරුමය, සුමාත්‍රාව, පිජී, බෝර්නියෝ, සිංගප්පූරුව, උගන්ඩාව, ජැමෙයිකාව හා නැගෙනහිර අප්‍රිකාව වැනි අනෙකුත් රටවලටද මෙම රබර් පැළ බෙදහැරීම සිදුවූයේ මින් පසුව ය. මේ නිසා ආසියාවේ රබර් වගාවේ තොටිල්ල ලෙස ලංකාව ප්‍රකට විය.

හෙනරත්ගොඩ උද්‍යානය තුළ 1876 දී සිටුවනු ලැබූ අංක 1 දරන මුල් රබර් ගස මීට අඩසියවසකට පෙර මියඳුනු අතර, එම වර්ෂයේම සිටවූ අංක 2 දරන රබර් ගස 1988 දී ඇතිවූ සුළි සුළඟකින් අවාසනාවන්ත ලෙස විනාශයට පත්වී ඇත. කෙසේ වුවද එම විනාශයට පත්වූ අංක 2 දරන රබර් ගස පැවැති ස්ථානයේ සලකුණු අදද දැකබලාගත හැකි ය. එහි එම ශාකයේ උපත හා විපත දැක්වෙන නාමපුවරුවක් ද වේ.

මෙම උද්‍යානයේ උඩවැඩියා නිවහන ද විවිධාකාර උඩවැඩියා වර්ග 100 කට වැඩි ප්‍රමාණයකින් සමන්විත වේ. එහි ඉතා අලංකාර මෙන්ම දුර්ලභ ගනයේ පැළෑටි අතර ඇන්තූරියම් , බෙගෝනියා සහ ඇලෙකේසියා මෙරටට හඳුන්වාදුන් පැළෑටි ද ඇතුළත් වේ. මල් පූදින කාලයේ මෙහි රෝසමල් උයන ද අමුත්තන්ගේ නෙත් සිත් නිතැතින්ම බැඳ ගනී.

දැනට ගම්පහ උද්‍යානය විවිධ වර්ගයේ ශාක වර්ග හා පැළෑටි හා මල්වර්ග 1500 ට වැඩි ප්‍රමාණයකින් සමන්විත ය. මෙහි සාදික්කා, කරාබුනැටි, ගම්මිරිස්, කුරුඳු වැනි විවිධාකාර වූ කුළුබඩු ශාක වර්ගවලින් සුසැදි කුළුබඩු උද්‍යානය විශේෂත්වයක් ගනී. මෙහි හරිතාගාර ක්‍රමය යටතේ සකස් කරන ලද ලංකික හා ජපන් පැළෑටි නිසා එය ඉතා මනහර ජපන් මල් වත්තක සිරියාව මතු කරයි.

මෙම උද්‍යානයේ උඩවැඩියා නිවහන ද විවිධාකාර උඩවැඩියා වර්ග 100 කට වැඩි ප්‍රමාණයකින් සමන්විත වේ. එහි ඉතා අලංකාර මෙන්ම දුර්ලභ ගනයේ පැළෑටි අතර ඇන්තූරියම් , බෙගෝනියා සහ ඇලෙකේසියා මෙරටට හඳුන්වාදුන් පැළෑටි ද ඇතුළත් වේ. මල් පූදින කාලයේ මෙහි රෝසමල් උයන ද අමුත්තන්ගේ නෙත් සිත් නිතැතින්ම බැඳ ගනී.



උද්‍යානය තුළ ළමයින් සඳහා වූ ළමා උයනක් ද ඇතුළත්වන අතර, උද්‍යානයේ නව සංවර්ධන වැඩ පිළිවෙළ යටතේ මෙම උද්‍යානය තුළට පිවිසෙන සංචාරකයන්ට හා නරඹන්නන්ට පහසුකම් රැසක් ද සලසාදීමට අපේක්ෂා කෙරේ. මෙම උද්‍යානය තුළ ට පැමිණෙන ළමුන්ගේ හා සංචාරකයන්ගේ හුදු විනෝදය සඳහා උද්‍යානය තුළ සංචාරය කිරීම සඳහා බක්කි කරත්තයක් ද ලංකා සංචාරක මණ්ඩලය විසින් මෙම උද්‍යානයට පරිත්‍යාග කර තිබේ.

❑